**ඇමුණුම - 04**

**<u>දෙහිඕවිට ප්‍රාදේශීය සභාව</u>**
**<u>නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා කමිටු වාර්තාව.</u>**

**ස්ථානය - දෙහිඕවිට ප්‍රාදේශීය සභා කාර්යාලය**
**දිනය - 2023.01.23**
**වේලාව - පෙ.ව. 10.00**

මෙදින සහභාගී විම,

1. යූ.ජී.සරත් විජේසිරි මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී / කමිටු සභාපති
2. විමුක්ති කුමාර ජයරත්න මැතිතුමා - ගරු උප සභාපති
3. ප්‍රියන්ත උදය කුමාර මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී
4. එච්.අමරාවතී මැතිණිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී
5. නීතා බාලසූරිය මැතිණිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී
6. රමණි පතිරණ මිය - කාර්මික නිළධාරී
7. එච්.ඩී.ලක්නුවන් ජයරත්න මහතා - උපාධිධාරී අභ්‍යාසලාභී

2023.01.23 දින ගරු නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා සභාපති යූ.ජී.සරත් විජේසිරි මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් දෙහිඕවිට ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී පැවැත් වූ නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාවේ වාර්තාවයි.

**01.දෙහිඕවිට දුම්රිය රක්ෂිතයේ මු.පි.කැ 3069 කැබැලි අංක 41 දරණ ඉඩම් කොටස සඳහා අංක 139, කැගල්ල පාර හා පදිංචි කේ.ඒ.කුලවතී මහත්මිය වෙත දීර්ඝකාලීන බදු බලපත්‍රයක් ලබා දීම සම්බන්ධයෙන් මෙම සභාවේ එකඟතාවය විමසමින් දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් විසින් යොමු කරන ලද ලිපිය.**

උක්ත කාරණයට අදාළව කේ.ඒ.කුලවතී මහත්මිය වෙත දීර්ඝකාලීන බදු බලපත්‍රයක් ලබා දීම සම්බන්ධයෙන් අදාළ බලපත්‍ර ලබාදෙන ඉඩමේ සංවර්ධන කටයුත්තක් හෝ ඉදිකිරීමක් සිදු කරන්නේ නම් ඒ සඳහා මෙම සභාවේ අනුමැතිය ලබා ගත යුතුයි යන කොන්දේසියට යටත්ව මෙම සභාවේ එකඟතාවය ලබා දීම සුදුසු බවට තීරණය විය.

**03. නිවසේ බිත්තියක් පුපුරා යාම සම්බන්ධයෙන් ඩී 256/4, මාගම්මන, දෙහිඕවිට හි පදිංචි එච්.එල්. චන්ද්‍රසේන මහතා විසින් යොමු කරන ලද ගැටළුව.**

මෙම ගැටළුවට අදාළ ස්ථානය පරීක්ෂා කිරීමෙන් පසුව තීරණයක් ගැනීම සුදුසු බවට තීරණය විය.

**04. නිවස අසළ ඉදිකරන ලද පැති බැම්ම හා එම බැම්ම මත ඉදිකර ඇති සැලැබ් එක සම්බන්ධයෙන් දෙහිඕවිට, කැන්දගස්පිටිය, නො. 318 හි පදිංචි ඩබ්.ජී.සුමිත් ලයනල් මහතා විසින් ඉදිරිපත් කරනු ලැබූ ගැටළුව.**

මෙම ගැටළුවට අදාළ ස්ථානය පරීක්ෂා කිරීමේදී සුමිත් ලයනල් මහතා විසින් ස්ලැබ් එකක් දමා ඇති බවත්, එම ස්ලැබ් එකේ කොණක් ඇන්ටන් අර්සකුලරත්න මහතාගේ නිවසට ප්‍රවේශ වන මාර්ගයේ වංගුවක් සේ ඇති ස්ථානයෙන් ගමන් කිරීමට අවහිර වන සේ ඇති බවත් නිරීක්ෂණය විය.

ඒ අනුව ඇන්ටන් අර්සකුලරත්න මහතාගේ නිවසට ප්‍රවේශ වන මාර්ගයේ වංගුවක් සේ ඇති ස්ථානයෙන් ගමන් කිරීමට අවහිරව ඇති සුමිත් ලයනල් මහතාගේ ස්ලැබ් එකෙහි කොටස කඩා ඉවත් කිරීමටත්, ඇන්ටන් අර්සකුලරත්න මහතා ඔහුගේ ඉඩමේ මායිමෙන් බැම්මක් බැඳීමටත් එකඟ වූ බැවින් එම එකඟතාව අනුව කටයුතු කරන ලෙස දෙපාර්ෂවයටම දැන්වීම සුදුසු බවට තීරණය විය.

**05. නිවසට යාබද ගොඩනැගිල්ලක් ඉදි කිරීමෙන් සිදු වන හිරිහැරය සම්බන්ධයෙන් අවිස්සාවේල්ල, මාදොළ, නො. 221/1 හි පදිංචි ඩී.කමලාවතී මහත්මිය විසින් ඉදිරිපත් කරනු ලැබූ ගැටළුව.**

මෙම ගැටළුවට අදාළ ස්ථානය පරීක්ෂා කිරීමේදී කමලාවතී මහත්මියගේ නිවස අසළ අළුතින් ඉදිකර ඇති ගොඩනැගිල්ලේ හිමිකරු සමඟ මෙම ගැටළුව සම්බන්ධයෙන් සාකච්ඡා කළ අතර ඉටු කළ යුතු කොන්දේසි සඳහා ධම්මික එදිරිසිංහ මහතා එකඟ වුවද එම විසඳුම් සඳහා කමලාවතී මහත්මිය එකඟ නොවූ බැවින් අවසන් එකඟතාවයකට පැමිණීමට නොහැකි විය.

එබැවින් මෙම ගැටළුව නාගරික සංවර්ධන අධිකාරිය වෙත යොමු කිරීම සුදුසු බවට තීරණය විය.